පැෆ්රල්

# ජනාධිපතිවරණය 2015

# පැෆ්රල් සංවිධානයේ දෙවන අතුරු වාර්තාව

## පසුබිම

ජනාධිපතිවරණය සඳහා සතියක කාලයක් ඉතිරිව තිබියදී ඇතිවූ අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් සමහර ප්‍රදේශවල ඡන්දදායකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව සීමා වී ඇති අතර, ආසන්න වශයෙන් දිස්ත්‍රික්ක 18 ක මිලියනයක පමණ ජනතාවක් අවතැන්වී සිටී.

මෙකී තත්ත්වයට පිළියමක් ලෙස ඉදිරි දින කිහිපය තුළදී මැතිවරණ කොමසාරිස්වරයා, පක්ෂ නියෝජිතයින් සහ අදාල නිලධාරීන් මුණගැසී අවතැන්වූවන්ගේ ඡන්දය භාවිත කිරීම පිළිබඳ සාකච්ඡාකොට තීරණයක් ගැනීමට නියමිතය. කෙසේ වුවත් කිසිදු දේශපාලන පක්ෂයකින් සිදුව ඇති සුවිශාල ව්‍යසනය හේතුවෙන් ජනාධිපතිවරණය කල්දැමීමට ඉල්ලීමක් කර නොමැත.

නොවැම්බර් 20 වෙනිදා වත්මන් ජනාධිපතිවරයා විසින් ජනාධිපතිවරණය පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශයට පත්කල නිවේදනයේ සිට මේ දක්වා වගකීමකින් යුතුව පැෆ්රල් සංවිධානය මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියේ යෙදී සිටී. කෙසේ වුවද ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමට පෙර සිටම ඒ සඳහා පැවතුණු සූදානම නිසාවෙන් පැෆ්රල් සංවිධානයට සිය නිරීක්ෂණ කටයුතු සම්පාදනය කර එහි මූලික අදියර අරඹා තිබුණි.

## තැපැල් ඡන්ද

2015 ජනාධිපතිවරණය සඳහා තැපැල් ඡන්ද භාවිතය පසුගිය දෙසැම්බර් 23 හා 24 යන දෙදින පැවැත්විනි. මෙම දෙදින තුළදී තැපැල් ඡන්දය භාවිත කල නොහැකිවූ තැපැල් ඡන්ද දායකයින් සඳහා දෙසැම්බර් 26 හා 30 යන දෙදින තුළදී ඊට අවස්ථාව ලබාදී තිබුණි.

තැපැල් ඡන්දය භාවිත කිරීම හා බැඳුණු සිදුවීම් කිහිපයක් පැෆ්රල් සංවිධානයට වාර්තා වූ අතර එලෙස වාර්තා වූ මුලු සිද්ධීන් 12 න් 6 ක් 25 වන දිනය අවසන් වන විට තහවුරු වී තිබුණි.

එම සිදුවීම් 6 න් 2 ක් බරපතල පහරදීම් වන අතර සිද්ධීන් 2 ටම අදාලව පුද්ගල රෝහල් ගතවීම් වාර්තා තිබුණි. මින් එක් සිද්ධියක් ත්‍රිකුණාමලය ගෝමරන්කඩවල ප්‍රදේශයෙන් වාර්තාවූ අතර අනෙක් සිදුවීම වාර්තාවූයේ මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය ප්‍රදේශයෙනි.

තැපැල් ඡන්දය අතරතුරදී වාර්තාවූ අනෙකුත් සිදුවීම් අතර ඡන්ද දායකයන්ට බලපෑම් කිරීම මැතිවරණ නිරීක්ෂකයන්ට බාධා කිරීම හා තර්ජනය කිරීම, මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා රජයේ රථවාහන භාවිත කිරීම, රාජ්‍ය සේවකයන්ට බලපෑම් කිරීම සහ රාජ්‍ය අංශයේ සේවකයින් මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීම යනාදිය පවතී.

## මැතිවරණ පදනම

මෙම මැතිවරණයේදී ඡන්දය ප්‍රකාශ කිරීමට සුදුසුකම් ලැබූ ඡන්දදායකයින් සංඛ්‍යාව 15,044,490 කි. ඒ අතරින් ඡන්දදායකයින් 400,000 ක ප්‍රමාණයක් තම අනන්‍යතාවය තහවුරු කිරීමට ජාතික හැඳුනුම්පත රහිතවූවන් බවට ගණන් බලා ඇත.

මැතිවරණ කොමසාරිස්වරයාගේ ඉල්ලීම මත මැතිවරණයට පෙර අවම වශයෙන් එම ඡන්දදායකයන්ගෙන් 40,000 වත් ජාතික හැඳුනුම්පත් ලබාදීම සඳහා වූ ප්‍රයත්නයක පැෆ්රල් සංවිධානය ඇතුළු නිරීක්ෂණ සංවිධාන නියුක්තව සිටියි.

ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නියම කර ඇති වලංගු අනන්‍යතා පත්‍රයක් අත්‍යවශ්‍ය සාධකයක් වන බැවින් මැතිවරණය සඳහා තාවකාලිකව හැඳුනුම්පත් ලබාගැනීමට උත්සුක වන ලෙස සෙසු පිරිසෙන් ඉල්ලීමක්ද කර තිබේ. එම කටයුත්තටද අයහපත් කාලගුණික තත්ත්වයත් ඒ නිසා ඇතිවූ ආපදා තත්ත්වයෙන් බාධා පැමිණ තිබුණි.

## පැෆ්රල් සංවිධානයේ ප්‍රයත්නය

මැතිවරණ නීති කඩකිරීම සහ බලය අවභාවිත කිරීම මැතිවරණ සමයේ සුලබව සිදුවෙන්නක් බැවින් ඊට ප්‍රතිරෝධයක් ලෙස මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය අතිශය වැදගත්වේ. පැෆ්රල් සංවිධානය මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලිය ප්‍රධාන ධාරා දෙකක් යටතේ සිදු කරනු ලබයි.ඉන් පළමුවැන්න ඍජු නිරීක්ෂණ ක්‍රියාවලිය වන අතර දෙවැන්න ඊට සම්බන්ධ වන විධිමත් පාර්ශවයන් සමග සහයෝගීව කරන නිරීක්ෂණයන් වේ.

ස්වකීය නිරීක්ෂණ ක්‍රියාවලියේදී පැෆ්රල් සංවිධානය ස්ථානගත නිරීක්ෂකයින් 11,200 ක් ද දිගුකාලීන නිරීක්ෂකයින් 335 ක්ද ජංගම නිරීක්ෂක කණ්ඩායම් 360 ක්ද යෙදවීමට කටයුතු කර ඇති අතර තැපැල් ඡන්ද මධ්‍යස්ථානවල ස්ථානීය නිරීක්ෂකයින් 1000 ක්ද යොදවා තිබුණි. තවද තැපැල් ඡන්ද දින නිරීක්ෂණ කටයුතු සඳහා විශේෂ ජංගම නිරීක්ෂණ කණ්ඩායම් 35 ක්ද යොදවන ලදී. මීට අමතරව දීප ව්‍යාප්තව 1250 ක් වූ ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථාන සඳහා පැෆ්රල් සංවිධානය විසින් නිරීක්ෂකයින් 100 දෙනෙකු යෙදවීමට කටයුතු සූදානම් කර ඇත.

මීට අමතරව ස්වේච්ඡා පදනම යටතේ නීතිඥයන් විසින් මෙහෙයවන නෛතික ක්‍රියාවලියක් පැෆ්රර් සංධානය විසින් මෙහෙයවනු ලැබේ. මේ වන තෙක් මෙම මැතිවරණය සම්බන්ධව කිසිදු නෛතික පිවරක් පැෆ්රල් සංවිධානය විසින් ගෙන නැති අතර අවශ්‍යවූ විටක එවැනි නීතිමය මැදිහත්වීම් සිදු කිරීමට පැෆ්රල් සංවිධානය සූදානම්ව සිටී. තවද නිරීක්ෂකයන්, පොලිස් දෙපාර්තමේන්තුව, මැතිවරණ කොමසාරිස් කාර්යාලය සමඟ නිරන්තර සම්බන්ධීකරණයට පැෆ්රල් ඇප කැප වී සිටී.

## පැෆ්රල් නිරීක්ෂණ

2014.12.30 වන දින වන විට ප්‍රචණ්ඩ ක්‍රියාද ඇතුළුව මැතිවරණ නීති සහ අනෙකුත් නීති උල්ලංඝණයන් 556 ක් සහ ඊට අදාල සිදුවීම් 565 ක් වාර්තාවී ඇත. (එක් සිදුවීමක් තුළ මැතිවරණ සහ අනෙකුත් නීති උල්ලංඝණයන් කිහිපයක් තිබිය හැක.)

පැෆ්රල් සංවිධානයේ වර්ගීකරණයන්ට අනුව එක් සිදුවීමක් තුළ මැතිවරණ සහ අනෙකුත් නීති උල්ලංඝණය කිරීම් කිහිපයක් අඩංගු විය හැකි බව මෙහිදී සඳහන් කල යුතු වේ. එයින් බරපතල ප්‍රචණ්ඩ ක්‍රියාවන්ට සහ නීති උල්ලංඝණයන්ට අදාල සිදුවීම් අතුරින් සිදුවීම් 162 ක් පැෆ්රල් සංවිධානයේ පැමිණිලි ඒකකය මගින් තහවුරු කරගත් ඒවා වන අතර 10 ක් තහවුරු නොවූ සිදුවීම්ය.

රාජ්‍ය දේපළ අවභාවිතය කිරීම සම්බන්ධයෙන් සිදුවීම් 147 ක් තහවුරු කරගත් සිදුවීම් වන අතර 32 ක් තහවුරු නොවූ ඒවා වේ. රාජ්‍ය දේපළ හා රජයේ සේවකයින් මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීම රාජ්‍ය සේවයේ නිලධාරීන්ට අලුතින් පත්වීම් ලබාදීම මෙතෙක් පැවති මැතිවරණ නිරීක්ෂණ ක්‍රියාවලියේදී ඉතා පැහැදිලිව දක්නට ලැබුණු නීති උල්ලංඝණයන්වේ.

එමෙන්ම මැතිවරණ ප්‍රචාරක කටයුතුවල නිරත පිරිස්වලට පහරදීම්වල ඉහළයාමක් දක්නට ලැබේ. බොහෝ සිදුවීම් මහජනතාව ගැවසෙන ස්ථානවල සිදුවූ අතර ඒවායේ ප්‍රචණ්ඩකාරී ස්වරූපයද ඉහළ මට්ටක පැවතුනි.

**විශේෂිත නිරීක්ෂණ**

1. 2010 ජනාධිපතිවරණ සමග සසඳා බැලීමේදී දින 40 ක්වූ සමස්ත මැතිවරණ ප්‍රචාරණ වකවානුව තුළ වාර්තාවී තිබූ සිදුවීම් ප්‍රමාණය 572 ක් වන අතර වත්මන් මැතිවරණයට (2014.12.30 වන දිනට) අදාලව දැනට වාර්තාවී ඇති සිදුවීම් ප්‍රමාණය 565 කි.

මින් නිරූපණය වන්නේ මෙම ජනාධිපතිවරණයේදී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සහ නිති උල්ලංඝණයන්වල ඉහළයාමකි. මෙම අගය එළඹෙන සතිය තුළදී විශාල වශයෙන් ඉහල යාමේ සම්භාවිතාවයක් පවතී.

2. 2010 සමග සසඳන කල්හි රාජ්‍ය දේපළ අයථා ලෙස භාවිත කිරීමේ සිද්ධීන් තෙගුණයකින් වර්ධනයවී ඇති බවක් පෙනේ. 2010 වසරේදී රාජ්‍ය දේපළ අයුතු ලෙස මැතිවරණය සඳහා යොදාගැනීමට සම්බන්ධ සිදුවීම් 53 ක් වාර්තාවූ අතර මෙම මැතිවරණය සඳහා තව සතියක කාලයක් ඉතිරිව තිබියදීත් එවැනි සිදුවීම් 147 ක් වාර්තාවී ඇත. මෙම මැතිවරණය සඳහා රාජ්‍ය දේපළ අවභාවිතය ක්‍රමානුකූලව හා සංවිධානාත්මකව සිදුවන බවක් පෙනෙන්නට තිබේ. මෙම තත්ත්වය ප්‍රධාන වශයෙන් දෙයාකාරයකින් දැක්විය හැකිය. එක් අතකින් සුබසාධක කටයුතු සඳහා වෙන්කර ඇති මුදල් දේශපාලනික අර්ථයෙන් යොදාගැනීම සහ අය- වැය යෝජනා මඟින් ප්‍රතිලාභ වැඩිකිරීම දේශපාලනික අර්ථයෙන් සිදුකිරීම වැනි සිදුවීම් දැක්විය හැකිය. අනෙක් අතින් විශ්‍රාමිකයන්ට ජංගම දුරකතන බෙදාදීම වැනි විශේෂ සුබසාධක කටයුතු දැකගත හැකිය. මේවා ජනාධිපතිවරණය සමග සමගාමීව සිදුකිරීම රාජ්‍ය දේපළ අවභාවිතයක් ලෙස නිර්වචනය කල හැකිය.

3. ප්‍රාදේශීය හා ජාතික මට්ටම නියෝජනය කරන දේශපාලකයින් විරුද්ධ පාක්ෂිකයින්ට සහ ඔවුන්ට සහාය දක්වන පිරිස්වලට සෘජුවම පහරදීමේ සම්භාවිතාවය ඉහළයාමක් දක්නට ලැබේ. මෙහිදී විකල්ප මත දරන්නන් සිය මතය සමාජගත කිරීමේදී ප්‍රසිද්ධියේම පහරකෑමට ලක්වීම විශේෂ සිදුවීමකි.

උදා - නව පරපුරෙහි කලාකරුවන්ට කුරුණෑගල වාරියපොල කුඹුක්ගැටේ ප්‍රදේශයේදී සිදුවූ පහරදීමට එක්සත් ජනතා නිදහස් සන්ධානයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකු සෘජුව සම්බන්ධවූ බව වාර්තාවීම.

මෙම පහරදීමේ අරමුණ මෙකී කටයුත්තට බාධා කිරීම පමණක් නොව ජනමතයට බලපෑම් කළ හැකි එවැනි කණ්ඩායම් බියපත් කිරිමට ගත් උත්සාහයක් බව සඳහන් කළ හැක.

## මැතිවරණ නීති උල්ලංඝණයවීම් පිළිබඳ විශ්ලේෂණය

(පූර්ව මැතිවරණ සමය : 2014.12.03 දක්වා)

(පැෆ්රල් සංවිධානයේ පැමිණිලි ඒකකයේ වර්ගීකරණයන්ට අනුව එක් සිදුවීමක් තුළ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් කිහිපයක් අඩංගුවිය හැකි බව සලකන්න.)

**2015 ජනාධිපතිවරණය පිළිබඳ සමාලෝචනය**

2014 දෙසැම්බර් 30 වෙනිදා දක්වා දත්ත විශ්ලේෂණය කර බැලීමේදී පෙනීයන්නේ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම්වල ඉහළයාමකි. එය සංඛ්‍යාත්මකව 656 ක් වන අතර ඉන් 556 ක්ම තහවුරු වූ මැතිවරණ නීති උල්ලංඝනයවීම් වේ. මෙකී කාලවකවානුව තුළදී තහවුරු නොවූ මැතිවරණ නීති උල්ලංඝනයවීම් 100 ක අධික සංඛ්‍යාවක් වාර්තාවී ඇත.

බස්නාහිර පළාතේ තහවුරු කරගත් සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 95 ක් වාර්තාවන අතර දකුණු පළාතෙන් වාර්තාවන්නේ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 91 කි. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 41 ක් හා ගම්පහ දිස්ත්‍රික්කයේ 32 ක් වාර්තාවී ඇත.

දකුණු පළාත තුළ මාතර දිස්ත්‍රික්කයේ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 41 ක්ද ගාල්ල දිස්ත්‍රික්කයේ 33 ක්ද වාර්තාවේ.

වයඹ පළාතෙහි සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් ප්‍රමාණය 79 කි. ඉන් 57 ක් කුරුණෑගල දිස්ත්‍රික්කයෙන්ද 22 ක් පුත්තලම දිස්ත්‍රික්කයෙන්ද වේ.

ඌව පළාතේ තහවුරු වූ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 54 ක් වාර්තාවූ අතර ඉන් 42 ක් බදුල්ල දිස්ත්‍රික්කයෙන් වාර්තාවිය.

උතුරු මැද පළාතේ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් ගණන 48 ක් වූ අතර ඉන් 35 ක් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් වාර්තාවී ඇත.

සබරගමුව හා නැගෙනහිර පළාතේ පිළිවෙලින් සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 46 ක් හා 39 ක් වාර්තාවන අතර උතුරු පළාතෙන් වාර්තාවන සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් ගණන 12 කි.


සබරගමුව පළාතෙහි රත්නපුර දිස්ත්‍රික්කයෙන් වාර්තාවන සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් ගණන 30 ක් වන අතර නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයෙන් වාර්තාවන්නේ සමස්ථ මැතිවරණ නීති උල්ලංඝණයවීම් 18 කි.

## 2010 ජනාධිපතිවරණය සමග සංසන්දනය


වත්මන් ජනාධිපතිවරයාගේ දෙවන වරට ඉදිරිපත්වූ ජනාධිපතිවරණය වූ 2010 ජනාධිපතිවරණය තුළදී වාර්තාවී තහවුරු කරගත් මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සංඛ්‍යාව 572 කි. (දින 40 ක් වූ පූර්ව මැතිවරණ සමය තුළ) මැතිවරණය ප්‍රකාශයට පත්කර දින 24 ක් තුළදී මෙවැනි ක්‍රියා 200 ක් වාර්තාවූ අතර තහවුරු නොවූ මැතිවරණ නීති උල්ලංඝණයවීම්ද සමගින් මුලු සිදුවීම් ප්‍රමාණය 757 ක් දක්වා ඉහළගොස් තිබුණි.


වත්මන් මැතිවරණ සමයෙහි මැතිවරණයට දින 9 කට පෙරාතුව එනම් මේ වන විට වාර්තාවූ සිදුවීම් ප්‍රමාණය 550 ක් ඉක්මවා ඇත. මැතිවරණයට දින 47 ක කාලවකවානුවක් තිබූ අතර ඉන් දින 39 ක් අවසානයේදී සිදුවී ඇති සිද්ධීන් ප්‍රමාණය අතිමහත්ය. 2010 දී මනුෂ්‍ය ඝාතන 4 ක් වාර්තා වූ අතර මැතිවරණ සම්බන්ධ පහර දීම් 127ක් ද, වෙඩි තැබීම් 18ක් ද වාර්තා විය. මෙම මැතිවරණයේදී තවම මනුෂ්‍ය ඝාතන වාර්තා නොවූවද බරපතල ගනයේ පහරදීම් වැඩි වීමක් දක්නට ලැබේ. තවද 2010 ජනාධිපතිවරණයේ වාර්තා වූ රාජ්‍ය දේපළ අවභාවිතයේ මුලු සිද්ධීන් 53ට සාපේක්ෂව, 2014 දෙසැම්බර් 30වන දින වන විට වාර්තා වී ඇති 147 වූ සිද්ධීන් ගණන ඉහල අගයක් ගනී. මේ අනුව සලකන ට මෙම මැතිවරණයේදී රාජ්‍ය දේපළ අවභාවිතය සුලබව සිදුවන මැතිරිවණ නීති උල්ලංඝණය කිරීම ලෙස සැලකිය හැකිය.

## ප්‍රචණ්ඩ ක්‍රියා වර්ගීකරණය (2014 දෙසැම්බර් 30 වනදිනට)




මැතිවරණ සම්බන්ධ ප්‍රචණ්ඩ ක්‍රියා යටතේ 162 ක් වාර්තා වී ඇත. මෙම වර්ගීකරණයට බරපතල පහරදීම්, පහර දීම් , බිය වැද්දීම් හා තර්ජන, චංචල හා නිශ්චල දේපළවලට හානි හා ගිණි අවි භාවිතය ඇතුලත් වේ.







2014 වර්ෂයේ දෙසැම්බර් 30 වන දින පස්වරු 2.00 වන විට මහනුවර දිස්ත්‍රික්කයෙන් ප්‍රචණ්ඩ ක්‍රියා ඉතා ඉහළ මට්ටමකින් වාර්තාවී ඇත. දැනට ලැබී ඇති දත්ත විශ්ලේෂණය කර බැලීමේදී ප්‍රචණ්ඩ සිද්ධීන්වලට අදාල මැතිවරණ සහ අනෙකුත් නීති උල්ලංඝනයන් 22 ක් මහනුවරින් වාර්තාවේ.

මහනුවර දිස්ත්‍රික්කයේ සිදුවන සිදුවීම් ප්‍රමාණය දිවයිනේ අනෙකුත් දිස්ත්‍රික්කවලට සාපේක්ෂව විශාල අගයක් ගන්නා අතර ඒවායේ ප්‍රචණ්ඩකාරී ස්වරූපයද වැඩිබවක් පෙනෙන්නට ඇත.

මැතිවරණ කාර්යාලවලට පහරදීම් 2 ක්ද බරපතල පහරදීම් 8 ක්ද මහනුවරින් වාර්තාවේ. කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් මෙවැනි ක්‍රියා 19 ක් වාර්තාවන අතර ඉන් 5 ක් බරපතල පහරදීම්ය. කොළඹින් මෙවැනි සිදුවීම් 2 ක්ද ගම්පහින් 2 ක්ද ගාල්ලෙන් 1 ක්ද හම්බන්තොටින් 3 ක්ද මාතරින් 1 ක්ද බදුල්ලෙන් 3 ක්ද කළුතරින් 1 ක්ද කෑගල්ලෙන් 1 ක්ද රත්නපුරයෙන් 3 ක්ද අනුරාධපුරයෙන් 3 ක්ද ත්‍රිකුණාමලයෙන් 1 ක්ද වාර්තාවන අතර මින් එක් සිද්ධියක්වත් බරපතල පහරදීම් ගණයට අයත් නොවේ.

සමස්ත සිද්ධීන්වලට අදාල රෝහල්ගතවීම් ප්‍රමාණය 48 ක් මෙම කාලය තුළ වාර්තාවේ.



මැතිවරණ කාර්යාලවලට පහරදීමේ හා ගිනිතැබීමේ සිද්ධි 7 ක් මාතරින් වාර්තාවන අතර මෙම සිද්ධීන් ඉතා බරපතල මෙන්ම පූර්ව විමර්ශිත සිද්ධීන්වීම විශේෂිතය.

අනෙකුත් දිස්ත්‍රික්කවලින් ගම්පහ සිද්ධීන් 1 ක්ද කළුතර සිද්ධීන් 2 ක්ද ගාල්ල සිද්ධීන් 1 ක්ද හම්බන්තොට සිද්ධීන් 1 ක්ද මහනුවර සිද්ධීන් 2 කද් බදුල්ල සිද්ධීන් 2 ක්ද මොණරාගල සිද්ධීන් 1 ක්ද කෑගල්ල සිද්ධීන් 3 ක්ද රත්නපුර සිද්ධීන් 3 ක්ද යාපනය සිද්ධීන් 1 ක්ද අනුරාධපුරය සිද්ධීන් 1 ක්ද පොළොන්නරුව සිද්ධීන් 3 ක්ද මඩකලපුව සිද්ධීන් 2 ක්ද ත්‍රිකුණාමලය සිද්ධීන් 2 පුත්තලම සිද්ධීන් 1 ක්ද කුරුණෑගල සිද්ධීන් 1 ක්ද යනාදී වශයෙන් අවම වශයෙන් මැතිවරණ කාර්යාලවලට පහරදීම් එකක්වත් ඇතුළත්ව වාර්තාවේ.

**රාජ්‍ය දේපළ අයුතු ලෙස භාවිතය සම්බන්ධ උල්ලංඝනයවීම්**

මෙම වර්ගීකරණය යටතේ රාජ්‍ය බලය අයුතු ලෙස භාවිතය රාජ්‍ය සේවකයන් හා දේපළ අවභාවිතය යනාදියෙන් තහවුරු කරන ලද දූෂණ ක්‍රියා 147 ක් හා තහවුරු නොවූ දූෂණ ක්‍රියා 32 ක් වාර්තාවී ඇත. මෙම වර්ගීකරණය යටතේ පළාත් මට්ටමේ වාර්තාගතවූ සිදුවීම් පහත පරිදි වේ.


1. බස්නාහිර පළාත - 26
2. දකුණු පළාත - 20
3. නැගෙනහිර පළාත - 16
4. වයඹ පළාත - 15
5. ඌව පළාත - 15
6. උතුරු මැද පළාත - 13
7. සබරගමුව පළාත - 11
8. මධ්‍යම පළාත - 9

මෙහිදී අඩුම මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා වාර්තාවන්නේ උතුරු පළාතෙන් වන අතර ප්‍රචණ්ඩ ක්‍රියා 4 කි. මෙම වර්ගීකරණය යටතේ වාර්තාවූ මුලු සිද්ධීන්ගෙන් සිද්ධීන් 18 ක්ම සමස්ත දිවයිනටම බලපාන සිද්ධීන් වේ.

පැෆ්රල් සංවිධානය විසින් කරන ලද මැතිවරණ නීති කඩවීම් සම්බන්ධ නිරීක්ෂණයේ සාරාංශ සලකාබැලීමේදී මැතිවරණ නීති කඩ කිරීමේ උප අංශයන් අතරින් රාජ්‍ය බලය හා දේපළ මැතිවරණ ක්‍රියාවලිය සඳහා අයුතු ලෙස භාවිත කිරීම තහවුරු කරන ලද සිදුවීම් 36 ක් වාර්තා කරමින් ඉහළින්ම පවතින අංශය ලෙස සැලකිය හැකිය.

මෙහිදී දෙවන ඉහළම සිදුවීම් ඇති උප අංශය ලෙස රාජ්‍ය නිලධාරීන්, ආරක්ෂක නිලධාරීන් මැතිවරණ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතයට ගැනීම තහවුරු කරන ලද සිදුවීම් 33 ක් වාර්තා වී ඇත. රාජ්‍ය නිලධාරීන්ට පත්වීම් ලබාදීම, ස්ථාන මාරුවීම් ලබාදීම ආශ්‍රිත සිද්ධීන් 31 ක් වාර්තා වී ඇත. මෙහි රජයේ වාහන මැතිවරණ සඳහා භාවිත කිරීම සම්බන්ධ උල්ලංඝණය කිරීම් 29 ක් ඇතුලත් ය.

රාජ්‍ය නිලධාරීන්ට බලපෑම් කිරීම සම්බන්ධ සිදුවීම් 18 ක් වාර්තා කරමින් එය අඩුම උල්ලංඝණය කිරීම් ඇතුළත් උප අංශය ලෙස සඳහන් කල හැක.




## වෙනත් උල්ලංඝනය කිරීම්


මෙම ප්‍රභේදකරණය යටතේ නීති විරෝධී ප්‍රචාරණ කටයුතු හා සහනාධාර දේශපාලනික අර්ථයෙන් ලබාදීම සම්බන්ධව තහවුරු වූ උල්ලංඝනයවීම් 247 ක් වාර්තාගතව ඇත. මෙහිදී ,

| | | | |
|---|---|---|---|
| 1. | බස්නාහිර පළාත | - | 54 |
| | ගම්පහ - | | 19 |
| | කොළඹ - | | 17 |
| 2. | දකුණු පළාත | - | 41 |
| | මාතර - | | 19 |
| | ගාල්ල - | | 17 |
| 3. | වයඹ පළාත | - | 33 |
| | කුරුණෑගල | | 24 |

වශයෙන් තහවුරු කරන ලද සිදුවීම් වාර්තාවී ඇත.

මෙම වර්ගීකරණය යටතේ නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණය සම්බන්ධ තහවුරු කරන ලද සිදුවීම් 62 ක්ද සහනාධාර දේශපාලනික අර්ථයෙන් ලබාදීමේ තහවුරු වූ සිද්ධීන් 61 ක්ද වාර්තාගතය.

2014 දෙසැම්බර් 30 වනදා වන විට දිවයින පුරා මෙම වර්ගීකරණය යටතේ සිද්ධීන් 24 ක් වාර්තාගතව ඇත.


අනෙකුත් මැතිවරණ නීති උල්ලංඝණය කිරීම්
දිනය -30.12.2014
කොළඹ 17
ගම්පහ 19
කලුතර 9
ගාල්ල 17
හම්බන්තොට 5
මාතර 19
නුවර 8
මාතලේ 5
නුවර එළිය 3
බදුල්ල 19
මොණරාගලල 4
කෑගල්ල 8
රත්නපුර13
යාපනය 2
මන්නාරම 1
කිලිනොච්චි 4
මුලතිව් 0
අනුරාධපුරය13
පොළොන්නරුව 7
අම්පර 6
මඩකලපුව 4
ත්‍රිකුණාමලය 7
පුත්තලම 9
කුරුණෑගල 24
දිවයින පුරා 24